# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2329/50 - 2023 අප්‍රේල් මස 28 වැනි සිකුරාදා - 2023.04.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය, ජීවන් තොන්ඩමන් වන මම, එකී මණ්ඩලයට මාතර V වන අදියර ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ කටුවන්ගොඩ ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**ජීවන් තොන්ඩමන්,**
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/02/MH/531.
2023 අප්‍රේල් මස 20 වැනි දින,
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

1A - G 39409 — 08 (2023/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 350 A - කටුවන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කටුවන්ගොඩ ගමේ පිහිටි, "කටුවලගේවත්ත සහ පුංචිලමාහාමිලාගේ කොරටුව", නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 80 ක් පමණ වන ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | - | පිඹුරු අංක මාර 2774 හි කැබලි අංක 01; |
| *නැගෙනහිරට* | - | පිඹුරු අංක මාර 2774 හි කැබලි අංක 01; |
| *දකුණට* | - | මාර්ගය; |
| *බටහිරට* | - | යූ.ඒ. කරුණාදාස මහතා හිමිකම් කියන ඉහළගේවත්ත ඉඩම සහ මාර්ගය; |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* : ඒ.එම්. පලිහවඩන මහතා සහ ඩී.සී. පලිහවඩන මහතා.
බංගලාව,
මාලිම්බඩ පාර,
කද්දුව,
තෙලිජ්ජවිල.

EOG 04-0200

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන විෂය භාර අමාත්‍ය, ජීවන් තොන්ඩමන් වන මම, එකී මණ්ඩලයට කොළොන්න-බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය II අදියරේ ජල ගබඩා ටැංකිය, පොම්පාගාරය හා නිල නිවාසය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් අත්කර ගැනීමට අංක 2224/04 හා 2021/04/19 දිනැති *ගැසට් පත්‍රයේ* පළකරන ලද ප්‍රකාශය මින් අවලංගු කරමි.

**ජීවන් තොන්ඩමන්,**
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/04/RN/467.
2023 මාර්තු මස 29 වැනි දින,
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

EOG 04-0199

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.